# මුදිතා භාවනාව

## අප්පමඤ්ඤා විභඞ්ගො ඇසුරින්

(බුද්ධ ජයන්ති ත්‍රිපිටක ග්‍රන්ථ මාලා, අභිධර්ම පිටකය, විභඞ්ගප්පකරණ 2 - පිටු අංක 80 - 102)

මුදිතාව (මුදිතා චේතෝ විමුක්තිය) වැඩීම මහත්ඵල මහානිසංස වෙයි.

## මුදිතාව යනු;

අනුන්ගේ සැප දැක සතුටු වීමක්, සතුටු වන බවක්, ප්‍රීතිමත් වීමක්, ප්‍රීතිමත් වන බවක් වේ ද මේ මුදිතාව නම් වෙයි.

මුදිතා භාවනාව (මුදිතාව වැඩීම) කෙසේ මහත්ඵල මහානිසංස වේ ද යත්;

- මෙලොව සහ පරලොව දුක් දුරු කිරීම පිණිස,
- මෙලොව සහ පරලොව ප්‍රීතිමත් ව, සැපවත් ව දිවි ගෙවීම පිණිස,
- සියලු දුකින් අත්මිදීම නම් වූ නිර්වාණය සාක්ෂාත් කිරීම පිණිස සහ
- අරතිය දුරු කිරීම පිණිස මුදිතාව වැඩීම හේතු වෙයි.

දුර ඈත විවේක සෙනසුන්හි වාසය කිරීමෙහි හෝ විවිධ වෙනත් අධිකුසල ධර්මයන්ගේ යෙදීමෙහි නොඇල්මෙක්, නොඇලීම් ස්වභාවයක්, ආශා රහිත බවක්, සිත් නොඅලවන බවෙක් වේ නම් මේ අරතිය නම් වෙයි.

## මුදිතා චේතෝ විමුක්තිය යනු;

තමන්ට ප්‍රිය වූ මනාප වූ යම් පුද්ගලයෙකු දැක සතුටු වන්නේ, ප්‍රීතිමත් වන්නේ යම් සේ ද එසේ ම සියලු සත්වයන් කෙරෙහි සතුටු වීමක්, සතුටු වන බවක්, ප්‍රීතිමත් වීමක්, ප්‍රීතිමත් වන බවක් වේ නම් එය **‘මුදිතාව’** නම් වෙයි.

ඒ ධර්මය සිතා නම් එය **‘චේතෝ’** නම් වෙයි.

සියලු අරතියෙන් මිදෙනුයි ‘**විමුක්ති**’ නම් වෙයි.

මෙසේ මුදිතා චේතෝ විමුක්තිය වෙයි.

## දිශා වශයෙන් පතුරවන මුදිතා භාවනාව වඩනා ආකාරය

මේ සසුනෙහි ශ්‍රැතවත් ආර්ය ශ්‍රාවකයා, තමන්ට ප්‍රිය වූ මනාප වූ එක් පුද්ගලයෙකු දැක ඔහු කෙරෙහි ප්‍රමුදිත (ප්‍රීතිමත්) වන්නේ යම් සේ ද, එසේ ම එක් දිශාවක වෙසෙන සියලු සත්වයන් කෙරෙහි මුදිතාව වඩයි. ඒ නිමිත්ත පුරුදු කරයි. වඩයි. බහුල ව වඩයි. හොඳින් පුරුදු කරයි. මනා සේ පුහුණු කරයි. නොනවත්වා පුහුණු කරයි. නැවත නැවත වඩවයි. ඉතා හොඳින් නිවැරදි ව නිශ්චය කරයි.

මෙසේ එක් දිශාවක වෙසෙන සියලු සත්වයන් කෙරෙහි මහත් වූ මහත් බවට පැමිණියා වූ අප්‍රමාණ වූ වෛර රහිත වූ ද්වේෂ රහිත වූ මුදිතාව උපයා ගෙන මුදිතා සහගත සිතින් වාසය කරයි.

මේ අයුරින් නැගෙනහිර දිශාවෙහි ද, බටහිර දිශාවෙහි ද, උතුරු දිශාවෙහි ද, දකුණු දිශාවෙහි ද, උඩ දිශාවෙහි ද, යට දිශාවෙහි ද, අනුදිශාවන්හි ද වෙසෙන සියලු සත්වයන් කෙරෙහි මහත් වූ මහත් බවට පැමිණියා වූ අප්‍රමාණ වූ වෛර රහිත වූ ද්වේෂ රහිත වූ මුදිතාව උපයා ගෙන මුදිතා සහගත සිතින් වාසය කරයි.

මෙසේ මුදිතා චේතෝ විමුක්තිය වැඩීම මේ ජීවිතයේ දී සැපවත් වීම (පළමු, දෙවන සහ තෙවන ධ්‍යාන ලැබීම) පිණිස ද, පරලොව දී රූපාවචර දිව්‍ය ලෝකයන්හි උපත පිණිස ද පවතිනු ඇත.